# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2240/6 – 2021 අගෝස්තු 09 වැනි සඳුදා – 2021.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැවතැන්න (274) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අළුපතකඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/MHN/2020/285 හා 2020.10.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'A' – අළුපතකඩ හේන සහ ඔරුවේහේන – **ප්‍රමාණය: හෙක්. 0.0340**

උතුරට: කල්‍යාණ ප්‍රබෝධ දිසානායක හිමිකම් කියන අළුපතකඩ හේන සහ ඔරුවේහේන; නැගෙනහිරට: හිමිකම සොයාගත නොහැකි අළුපතකඩ හේන සහ ඔරුවේහේන; දකුණට: මාර්ගය; බටහිරට: කල්‍යාණ ප්‍රබෝධ දිසානායක හිමිකම් කියන අළුපතකඩ හේන සහ ඔරුවේහේන.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2019/WS/588.
2021 ජුනි මස 16 වැනි දින.
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 – 330